5670

AL/2026/25 B/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
※ **I කොටසෙහි 1- 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
※ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 6 | |
| 2 | 7 - 15 | |
| 3 | 16 - 21 | |
| 4 | 22 - 26 | |
| 5 | 27 - 35 | |
| 6 | 36 - 40 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ඇල්ප්ස් (2) ඇපිනයින් (3) මයිසීනියන් (4) කාර්පේතියන් (5) කොකේසස් (.........)

**2.** (1) තේලීස් (2) පයිතගරස් (3) හෙරක්ලීටස් (4) ඩිමොක්‍රිටස් (5) සෙනෙකා (.........)

**3.** (1) ඇක්‍රොපොලිස් (2) ඇකඩෙමි (3) ලයිසියම් (4) සැලර්නෝ (5) බොලොඤ්ඤා (.........)

**4.** (1) එට්‍රුස්කන් (2) ගෝල් (3) අම්බ්‍රියන් (4) ලතින් (5) සැම්නයිට් (.........)

**5.** (1) ක්ලෝඩියස් (2) ට්‍රාජන් (3) සිසරෝ (4) ඩයක්ලීෂියන් (5) ජස්ටීනියන් (.........)

**6.** (1) බූර්බෝන් (2) හොහෙන්සොලර්න් (3) ටියුඩර් (4) ගොන්සාගා (5) සැවෝයි (.........)

[දෙවැනි පිටුව බලන්න.

7. (1) කොන්ස්තන්තිනෝපලය (2) ජිනෝවා (3) වෙනීසිය
(4) ෆ්ලොරන්ස් (5) මිලාන් (.........)

8. (1) කැස්ටීල් (2) ඇරගන් (3) නවාර්
(4) ග්‍රැනඩා (5) වූලෝං (.........)

9. (1) ධනවාදය (2) ලිබරල්වාදය (3) ඒකදේවවාදය
(4) සමාජවාදය (5) අරාජකවාදය (.........)

10. (1) කෝල්බෙයාර් (2) රොබෙස්පියර් (3) කැලෝන්
(4) ටර්ගෝ (5) නෙකර් (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද **එකිනෙකට නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) සොෆොක්ලීස් - ඊඩිපස් රෙක්ස්
(2) ප්ලේටෝ - ජනරජය (The Republic)
(3) වර්ජිල් - ඊනිඩ්
(4) ඩාන්ටේ ඇලිගියෙරි - දිව්‍ය ප්‍රහසනය (Divine Comedy)
(5) වොල්ටෙයාර් - ආණ්ඩුව පිළිබඳ රචනා දෙකක් (Two Treatises of Government) (.........)

12. (1) මැසිඩෝනියානු අධිරාජ්‍යය - මහා ඇලෙක්සැන්ඩර්
(2) රෝම අධිරාජ්‍යය - ඔගස්ටස්
(3) බයිසැන්ටියානු අධිරාජ්‍යය - කොන්ස්ටන්ටයින්
(4) කැරොලින්ජියානු අධිරාජ්‍යය - චාලිමේන්
(5) ජර්මානු අධිරාජ්‍යය - වික්ටර් එමානුවෙල් (.........)

13. (1) ජුපිටර් - ආකාශයට අධිපති දෙවියා
(2) මිනෙර්වා - ප්‍රඥාවට අධිපති දෙව්දුව
(3) වීනස් - දඩයමට අධිපති දෙව්දුව
(4) මාර්ස් - යුද්ධයට අධිපති දෙවියා
(5) නෙප්චූන් - සයුරට අධිපති දෙවියා (.........)

14. (1) ක්‍රිස්ටෝෆර් කොලම්බස් - නැගෙනහිර ඉන්දීය කොදෙව් සොයාගැනීම
(2) අමෙරිගෝ වෙස්පූචි - අමෙරිකානු ප්‍රධාන භූමිය සොයාගැනීම
(3) වස්කෝ ද බැල්බෝවා - පැසිෆික් සාගරය සොයාගැනීම
(4) ෆර්ඩිනන්ඩ් මැගලන් - ලෝකය වටා යාත්‍රා කිරීම
(5) හර්නැන්ඩෝ කෝටීස් - මෙක්සිකෝව ජය ගැනීම (.........)

15. (1) ජෝන් කේ - දුවන නඩාව
(2) ජේම්ස් හාග්‍රීව්ස් - ස්පිනිං ජෙනිය
(3) ජේම්ස් වොට් - ආරක්ෂක ලාම්පුව
(4) විලියම් සීමන්ස් - විවෘත උදුන් ක්‍රමය
(5) ජෝර්ජ් ස්ටීවන්සන් - දුම්රිය එන්ජිම (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) ප්‍රොටගරස් | A - 'මිනිසා නිදහස්ව උපත ලබා ඇත; සෑම තැන්හිම ඔහු යදමින් බැඳී ඇත.' |
| (ii) සොක්‍රටීස් | B - 'මිනිසා දේශපාලන සත්වයෙකි.' |
| (iii) ප්ලේටෝ | C - 'සද්ගුණය වූකලී දැනුම යි.' |
| (iv) ඇරිස්ටෝටල් | D - 'සියල්ල මනින මිනුම් දණ්ඩ මිනිසා ය.' |
| (v) රූසෝ | E - 'දාර්ශනිකයන් රජුන් විය යුතු ය.' |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D B C A (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) ඉතාලිය | A - ඇංග්ලිකන් |
| (ii) ග්‍රීසිය | B - ප්‍රොතෙස්තාන්තවාදී |
| (iii) තුර්කිය | C - සාධර්මික (ඕතොඩොක්ස්) |
| (iv) එංගලන්තය | D - රෝමානු කතෝලික |
| (v) නෙදර්ලන්තය | E - ඉස්ලාම් |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D A C B (.........)

**18.**

| X | Y |
|---|---|
| (i) නිකොලෝ මකියාවෙලි | A - ජීවීන්ගේ සම්භවය (Origin of Species) |
| (ii) මොන්ටෙස්කියු | B - දාස් කපිටාල් (Das Kapital) |
| (iii) චාල්ස් ඩාවින් | C - යුද්ධය හා සාමය |
| (iv) කාල් මාක්ස් | D - කුමාරයා |
| (v) ලියෝ තොල්ස්තෝයි | E - නීතියේ සාරය (The Spirit of the Laws) |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D A C B (.........)

**19.**

| X | Y |
|---|---|
| (i) අඳුරු මහාද්වීපය | A - තුර්කිය |
| (ii) නව ලෝකය | B - ඉතාලිය |
| (iii) සාප්පුකාර ජාතිය | C - අමෙරිකානු මහාද්වීපය |
| (iv) හුදු භූගෝලීය ප්‍රකාශයක් පමණකි | D - අප්‍රිකානු මහාද්වීපය |
| (v) යුරෝපයේ රෝගියා | E - එංගලන්තය |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E B D C A (5) E D A C B (.........)

**20.**

| X | Y |
|---|---|
| (i) ජොශෆ් ස්ටාලින් | A - අමෙරිකා එක්සත් ජනපදය |
| (ii) හැරී ට්‍රෑමන් | B - ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව |
| (iii) ක්ලෙමන්ට් ඇට්ලී | C - ප්‍රංශය |
| (iv) චාල්ස් ඩි ගෝල් | D - බ්‍රිතාන්‍යය |
| (v) කොන්රාඩ් ඇඩිනුවර් | E - සෝවියට් දේශය |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A D C B (5) E D A C B (.........)

PAST PAPERS WIKI

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. යුරෝපය කෙරෙහි ඉස්ලාම් ශිෂ්ටාචාරයේ බලපෑම**

(1) පර්සියානු කාව්‍යවල, විශේෂයෙන් ම රුබයියාට්හි බලපෑම
(2) රෝම ඉලක්කම් හඳුන්වාදීම
(3) වාරිකර්මාන්ත තාක්ෂණය හා කඩදාසි නිෂ්පාදනය වැනි ඉස්ලාම් තාක්ෂණික ජයග්‍රහණ උකහාගැනීම
(4) අරාබිවරුන් වෙතින් සුවඳ විලවුන්, බුමුතුරුණු හා බ්‍රොකේඩ් රෙදි ලබාගැනීම
(5) බොහෝ අරාබි වචන භාවිතයට ගැනීම (.........)

Past Papers Wiki



22. **වැඩවසම් ක්‍රමය**

(1) මධ්‍යතන යුරෝපයේ පැවති දේශපාලන හා ආර්ථික ක්‍රමය, වැඩවසම් ක්‍රමය යනුවෙන් හැඳින්වේ.
(2) වැඩවසම් ක්‍රමය යටතේ දේශපාලන විකේන්ද්‍රගත වීමක් දක්නට ලැබුණි.
(3) වැඩවසම් සබඳතා ඉඩම මත පදනම්ව පැවතුණි.
(4) කිරීටයෙන් ලද ඉඩම් භුක්ති විඳි රදළයෝ යුද්ධ අවස්ථාවලදී රජවරුන්ට භට හමුදා සපයා දුන්හ.
(5) වැඩවසම් ක්‍රමය යටතේ ඉතා දියුණු වෙළෙඳාමක් පැවතුණි. (.........)

23. **රෙපරමාදු ව්‍යාපාරය**

(1) ඉතාලියේ ආරම්භ විය.
(2) රෙපරමාදු ව්‍යාපාරය යනු කතෝලික පල්ලියේ දූෂණවලට එරෙහිව ඇති වූ විරෝධතා ව්‍යාපාරයකි.
(3) මාටින් ලූතර් විසින් විටෙන්බර්ග් දේවස්ථාන දොරටුවේ කරුණු අනූපහකින් යුත් ලියවිල්ල ප්‍රදර්ශනය කිරීම රෙපරමාදු ව්‍යාපාරයේ ආරම්භය සලකුණු කළේ ය.
(4) ජෝන් කැල්වින් ප්‍රොතෙස්තාන්තවාදය ප්‍රචාරය කළේ ය.
(5) රෙපරමාදු ව්‍යාපාරය, මධ්‍යතන යුරෝපයේ පැවති ආගමික ඒකාබද්ධතාව අවසන් කළේ ය. (.........)

24. **ප්‍රංශ විප්ලවය**

(1) සමාජයේ විවිධ කණ්ඩායම් 'ආදී තන්ත්‍රයට' එරෙහිවීම ප්‍රංශ විප්ලවයට තුඩුදුන් ප්‍රධාන හේතුවක් විය.
(2) ප්‍රංශ විප්ලවය නිර්ධන පාංතික විප්ලවයක් වශයෙන් අර්ථ නිරූපණය කෙරේ.
(3) ප්‍රංශ විප්ලවයේ ඇතැම් නායකයෝ අමෙරිකානු විප්ලවයේ ආභාසය ලැබූහ.
(4) ප්‍රංශ විප්ලව සමයේ දී බූර්බෝන් රාජාණ්ඩුව බලයෙන් පහ කෙරිණි.
(5) ප්‍රංශ විප්ලවය යුරෝපා ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් සලකුණු කරයි. (.........)

25. **ජර්මානු සංයුක්තය**

(1) ජර්මානු සංයුක්තය වූ කලී රාජ්‍ය තිස්නවයක සන්ධානයකි.
(2) ජර්මානු සංයුක්තය වියනා සම්මේලනයේදී පිහිටුවනු ලැබීය.
(3) ඔස්ට්‍රියාව ජර්මානු සංයුක්තයේ ආධිපත්‍යය දැරීය.
(4) ප්‍රෂියාව ජර්මානු සංයුක්තයේ උද්යෝගී ආධාරකරුවෙකු විය.
(5) 1866 ඔස්ට්‍රො-ප්‍රෂියානු යුද්ධයෙන් පසුව ජර්මානු සංයුක්තය වෙනුවට උතුරු ජර්මානු සංයුක්තය පිහිටුවන ලදී. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ............................................. **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ............................................. **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ............................................. **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ............................................. **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

26. පුනරුදය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) 'පුනරුදය' යන වචනයේ අර්ථය වනුයේ පුරාණ ග්‍රීසියේ හා රෝමයේ පැවති සම්භාව්‍ය සංස්කෘතිය පුනර්ජීවනයට පත්වීම යන්නයි.
(B) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම පුනරුදය ඇතිවීමට මග පෑදී ය.
(C) දසවන ලියෝ පාප්වරයා පුනරුද කලාකරුවන්ට අනුග්‍රහ දැක්වී ය.
(D) පුනරුද සමයේදී ගොතික් කලාව වර්ධනය විය. (.........)

27. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) 1688 විප්ලවයේදී රජු අභිබවා පාර්ලිමේන්තුව ජයග්‍රහණය කළේ ය.
   (B) අගමැති තනතුර දහ අටවන සියවස මුල් අවධියේදී තහවුරු විය.
   (C) 1832 ප්‍රතිසංස්කරණ පනත මගින් සර්වජන ඡන්ද බලය ප්‍රදානය කෙරිණි.
   (D) 1911 දී සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කරන ලදී. (.........)

28. නැපෝලියන් බොනපාට් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) නැපෝලියන් බොනපාට් ගිරොඩින්වරුන්ට නායකත්වය දුන්නේ ය.
   (B) නැපෝලියන් බොනපාට් 1804 සිට 1814 දක්වා ප්‍රංශ අධිරාජයා විය.
   (C) නැපෝලියන් බොනපාට් 'විප්ලවය නම් මම වෙමි' යනුවෙන් ප්‍රකාශ කළා යැයි සඳහන් වේ.
   (D) මහාද්වීපික ක්‍රමය මගින් එංගලන්තය පරාජය කිරීමට නැපෝලියන් බොනපාට් සමත් වූයේය. (.........)

29. 1917 රුසියානු විප්ලවය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) රුසියානු විප්ලවය අවස්ථා දෙකකින් සිදු විය: මාර්තු (පෙබරවාරි) විප්ලවය සහ නොවැම්බර් (ඔක්තෝබර්) බොල්ෂෙවික් විප්ලවය
   (B) 1917 විප්ලවයෙන් පසු ලොව ප්‍රථම කොමියුනිස්ට් රාජ්‍යය පිහිටුවන ලදී.
   (C) රුසියානු විප්ලවය ඇලෙක්සැන්ඩර් කෙරෙන්ස්කි විසින් මෙහෙයවන ලදී.
   (D) ලියොන් ට්‍රොට්ස්කි ප්‍රථම පස් අවුරුදු සැලැස්ම දියත් කළේය. (.........)

30. ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) වර්සායි සාම සම්මුතිය මගින් 1919 දී ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී.
   (B) ජාතීන්ගේ සංගමයේ මූලස්ථානය නිව්යෝර්ක් හි පිහිටා තිබිණි.
   (C) ප්‍රධාන අරමුණු වූයේ සාමූහික ආරක්ෂාව මගින් සාමය පවත්වාගෙන යාම හා ජාත්‍යන්තර සහයෝගීතාව දිරිගැන්වීම යි.
   (D) අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමය තුළ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේ ය. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. 'දෙවියන්ගේ නගරය' (City of God) කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) ශාන්ත ජෙරොම් (2) ශාන්ත ඇම්බ්‍රෝස් (3) ශාන්ත ඔගස්ටීන්
   (4) ශාන්ත බෙනඩික්ට් (5) ශාන්ත තොමස් ඇක්වයිනාස් (.........)

32. රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ 'අන්තිම විනිශ්චය' සිතුවම අඳින ලද ප්‍රකට කලාකරුවා කවුද?
   (1) ජියෝටෝ (2) මසැෂියෝ (3) බොටිචෙලී
   (4) ලියනාඩෝ ඩා වින්චි (5) මයිකලාංජලෝ (.........)

33. 1864 දී ඩෙන්මාර්කයට එරෙහිව ඔස්ට්‍රියාව හා ප්‍රෂියාව විසින් යුද ප්‍රකාශ කිරීමට හේතු වූ ගැටුම නිර්මාණය වූයේ කවර පළාත් පදනම් කරගෙන ද?
   (1) පීඩ්මොන්ට් හා සාර්ඩිනියා (2) ලොම්බාඩි හා වෙනීෂියා (3) නේපල්ස් සහ සිසිලි
   (4) ෂ්ලෙස්විග් හා හොල්ස්ටයින් (5) ඇල්සාස් හා ලොරේන් (.........)

34. රුසියාවේ ප්‍රවේණි දාසයන්ට විමුක්තිය ලබාදුන් සාර්වරයා කවුද?
   (1) පළමුවන ඇලෙක්සැන්ඩර් (2) පළමුවන නිකලස් (3) දෙවන ඇලෙක්සැන්ඩර්
   (4) තෙවන ඇලෙක්සැන්ඩර් (5) දෙවන නිකලස් (.........)

35. නොබැඳි ජාතීන්ගේ නායකයෙකු ලෙස පත් වූ යුගෝස්ලාවියානු ජනාධිපතිවරයා කවුද?
   (1) මාෂල් ටිටෝ (2) විලී බ්‍රාන්ට් (3) හෙල්මුට් ෂ්මිට්
   (4) මිලොසොවිච් (5) ලෙහ් වලෙන්සා (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | රෝමය හා කාර්තේජය අතර හටගත් යුද්ධය පෙලපොනිසියානු යුද්ධය ලෙස හැඳින්වේ. | මිලේච්ඡ ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම සිදුවිය. | (………) |
| **37.** | යුරෝපා ඉතිහාසයේ මධ්‍යතන යුගය අඳුරු යුගයක් ලෙස ඇතැම් ඉතිහාසඥයෝ අර්ථ දක්වති. | යුරෝපයේ මුල් මධ්‍යතන යුගයේදී ප්‍රධානතම අධ්‍යාපනික මධ්‍යස්ථාන වූයේ, ඉන් සමහරක් පසුකාලීනව විශ්වවිද්‍යාල බවට පත් වූ කැතීඩ්‍රල් පාසල් ය. | (………) |
| **38.** | වෙස්ට්ෆේලියා ගිවිසුම නූතන යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සලකනු ලැබේ. | තිස් අවුරුදු යුද්ධාවසානයේ එළඹි වෙස්ට්ෆේලියා ගිවිසුම, යුරෝපයේ ආගමික යුද්ධ අවසන් කොට, එහි නූතන රාජ්‍ය-ක්‍රමය නැගී ඒමට මග පෑදී ය. | (………) |
| **39.** | සරයේවෝ නුවර දී ඔස්ට්‍රියාවේ ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා සහ ඔහුගේ බිරිඳ ඝාතනය කරනු ලැබීම පළමුවන ලෝක යුද්ධයට ආසන්නතම හේතුව විය. | හිරෝෂිමා සහ නාගසාකි වෙත පරමාණු බෝම්බ හෙලීමෙන් පළමුවන ලෝක යුද්ධය අවසන් විය. | (………) |
| **40.** | ස්ටාලින් විසින් ක්‍රියාත්මක කරන ලද නව ආර්ථික ප්‍රතිපත්තිය සිරවි යුද්ධයේ ආරම්භය සනිටුහන් කළේ ය. | මිහායිල් ගොර්බචොෆ් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය සෝවියට් දේශයේ බිඳවැටීමට මග පෑදී ය. | (………) |

❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25 B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**

※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**

※ **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.

※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) ඇඩ්‍රියාතික් මුහුද | (ii) රයින් ගඟ | (iii) පිරනීස් |
| (iv) බොස්ෆරස් සමුද්‍ර සන්ධිය | (v) සාර්ඩිනියා | (vi) ජිනෝවා |
| (vii) ඇම්ස්ටර්ඩෑම් | (viii) ඩෙන්මාර්කය | (ix) අයර්ලන්තය |
| (x) මැන්චෙස්ටර් | (xi) වියනා | (xii) ක්‍රිමියාව |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)

## B කොටස

2. (i) ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

(ii) ග්‍රීක පෞර රාජ්‍යවල පැවති විවිධ ආණ්ඩුක්‍රම විස්තර කරන්න. (ලකුණු 08 යි)

3. "මධ්‍යතන යුගයෙන් නූතන යුගයට යුරෝපයේ දේශපාලන පරිවර්තනය සිදුවීම ජාතික රාජ්‍යයන්හි වර්ධනය මගින් සලකුණු කරයි."

(i) පහළොස්වන හා දහසයවන සියවස්වල ජාතික රාජ්‍ය වර්ධනය වූ යුරෝපා රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කරන ලද ජාතික රාජ්‍ය පිහිටුවීමට පුරෝගාමී වූ පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) ජාතික රාජ්‍යයක් යන්නෙන් කුමක් අදහස් වේදැයි නිර්වචනය කරන්න. (ලකුණු 03 යි)

(iv) එක් යුරෝපා රටක් ඇසුරෙන් ජාතික රාජ්‍යයක් වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 09 යි)

4. දහසය වන සියවසේ යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

[අවවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සාහිත්‍යය හා විද්‍යාව යන ක්ෂේත්‍රවල ග්‍රීකයන්ගේ කාර්යසාඵල්‍යය

(ii) පියුනික් යුද්ධ අවසානය දක්වා රෝම බල ව්‍යාප්තිය

(iii) කාදිනල් රිච්ලියු

(iv) සත් අවුරුදු යුද්ධය (ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** (i) 1849 තෙක් ඉතාලිය එක්සත් කිරීමට ගන්නා ලද උත්සාහයන් අසාර්ථක වූයේ මන්ද? (ලකුණු 06 යි)

(ii) ඉතාලිය එක්සත් රාජ්‍යයක් බවට පත් වූයේ කෙසේ ද? (ලකුණු 10 යි)

**7.** "ෆැසිස්ට්වාදයේ හා නට්සිවාදයේ ස්වරූපයෙන් ඉතාලියේ හා ජර්මනියේ ඒකාධිපතිවාදය නැගී ඒම දෙවන ලෝක යුද්ධය හටගැනීම නොවැළැක්විය හැකි තත්ත්වයට පත් කළේ ය."

(i) ඉතාලියේ ෆැසිස්ට් නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) ජර්මනියේ නට්සි නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) ෆැසිස්ට්වාදයේ හා නට්සිවාදයේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 04 යි)

(iv) ඉතාලියේ හා ජර්මනියේ ෆැසිස්ට්වාදය හා නට්සිවාදය නැගීම දෙවන ලෝක යුද්ධය හටගැනීමට කෙතෙක් දුරට හේතුවීදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

**8.** (i) එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු කවරේ ද? (ලකුණු 03 යි)

(ii) එය සංවිධානය වී ඇත්තේ කෙසේ ද? (ලකුණු 03 යි)

(ii) 1980 දක්වා ප්‍රධාන ගැටුම් විසඳීමෙහි ලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාර්ථකත්වය ප්‍රමාණ කරන්න. (ලකුණු 10 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සමුළු ක්‍රමය

(ii) සොල්වරයින්

(iii) ලුවී නැපෝලියන්

(iv) නිරවි යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library